සුව සටහන්



වෛද්‍ය හර්ෂ අලුත්ගේ
Dr Harsha Aluthge
MBBS, FRACGP, DFM RCGP(UK)
General Practitioner
Greenvale Medical Centre

# පිත්තාශයේ ගල් ඇතිවීම (Gollstone)

පිත්තාශය හෙවත් (Gall Bladder) යනු අපගේ ශරීරයේ පිත හෙවත් ඉසකෑ නමැති මේදමය ආහාර දිරවීමට අවශ්‍ය කරන දියරය ගබඩා කරන කුඩා අවයවයකි. මෙය අපගේ අක්මාව (Liver) ආශ්‍රිතව පිහිටා ඇති අතර අක්මාව මගින් ස්‍රාවය කරන පිත ගබඩා කිරීම එහි කාර්යයි.

පිත්තාශය තුලදී එම පිත; කොලෙස්ටරෝල් හා කැල්සියම් ලවණ සාන්ද්‍රණය වී යහමින් (Gall Stone) ඇතිවේ. මෙය ඉතා සුලභ රෝගි තත්වයක් වන අතර වයස අවුරුදු 50 ට වැඩි උදවියගෙන් 15% කට පමණ මෙම රෝගය වැළදිය හැකිය.

පිත්තාශය තුල ගල් ඇති වූ පමණින්ම රෝග ලක්‍ෂණ පෙන්නුම් නොකරන අතර එම ගල් පිත්තාශයේ නාල අවහිර කිරීමෙන් ඇති වන ආසාදනය (infection) හෝ ඉදිමීම (inflammation) නිසා රෝග ලක්‍ෂණ පෙන්නුම් කළ හැකිය.

**රෝග ලක්‍ෂණ මොනවද?**

පිත්තාශයේ ගල් ඇති උදවියගෙන් 70% පමණ කිසිදු රෝග ලක්‍ෂණයක් නොපෙන්වති. පහත සඳහන් රෝග ලක්‍ෂණ එකක් හෝ කිහිපයක් පෙන්නුම් කල හැකිය.

- උදරයේ හා කොන්දේ ඇති වන වේදනාව උදරයේ ඉතා තදබල වේදනාවක් ඇති විය හැකිය.
- මේදමය ආහාරයක් ගත් පසු උදරයේ වේදනාව උත්සන්න වීම.
- Jaundice නැමැති ඇස් කහ පැහැවීම
- පිත්තාශය හෝ වහි කාල ආසාදන වූවහොත් උණ ඇතිවීම

**පිත්තාශයේ ගල් ඇතිවීම හේතු හා අවදානම් සාධක මොනවද ?**

- කාන්තාවන් හට රෝගය ඇතිවීමේ ප්‍රවණතාව වැඩිය.
- තරබාරු උදවියට රෝගය වැඩිපුර වැළදේ.
- පවුලේ රෝග ඉතිහාසයක් පැවතීම

පිත්තාශයේ ගල් ඇතිවීමට තනි හේතුවක් හෝ නිශ්චිත හේතුවක් පැවසිය නොහැකිය. සමහර විට අක්මාව මගින් අධිකව කොලෙස්ටරෝල් හා පිත්ත වර්ණක ස්‍රාවය වීම මඟින් ඒවා ඝනවීමෙන්, ගල් ඇතිවිය හැක. එසේම පිත්තාශයෙන් පිත පිටකරන නාල අවහිර වීමෙන් පිත එකතුවී සාන්ද්‍ර වීමද හේතු විය හැකිය.

**රෝගය නිර්ණය කරගන්නේ කෙසේද ?**

වෛද්‍යවරයා විසින් පහත සඳහන් ක්‍රම එකක් හෝ කිහිපයක් මගින් රෝගය ඇති බවට නිර්ණය කරගනු ලැබේ.

- රෝග ඉතිහාසය මගින් හා ශාරීරික පරීක්‍ෂාව මගින්
- Ultra sound Scan මගින්

ERCP (Endoscopic Retrograde Cholangio Pancreatography) නැමැති පරීක්‍ෂණ මගින්. මෙහිදී Endoscope නමැති කැමරාවක් සවිකල බටයක් වැනි උපකරණයක් මගින් වර්ණකයක් යවා පැහැදිලි රූපරාමු ලබා ගැනීම සිදු කරනු ලැබේ.

- HIDA නමැති ස්කෑන් පරීක්‍ෂණය
- MRI ස්කෑන්

**පිත්තාශයේ ගල් පැවතිමෙන් ඇති වන අතුරු ආබාධ මොනවද ?**

- Biliary Colic පිත්තාශයේ ගෙල කොටසේ ගල් හිණවීමෙන් අවහිරවීම නිසා ඇතිවන තදබල උදරයේ වේදනා තත්වය.
- Cholecystitis - පිත්තාශයේ ආසාදනය වී ඉදිමීම නිසා මේ තත්වය ඇතිවේ. තදබල උදරයේ වේදනාව, ඔක්කාරය, වමනය, උණ වැනි රෝග ලක්‍ෂණ ඇති විය හැකිය.
- Jundice නැමැති ඇස් කහපැහැ ගැන්වීම පිත්තාශයේ නාල අවහිරවීමෙන් පිත රුධිරයට ස්‍රාවයවීම මඟින් පිත්ත වර්ණක වැඩි වී ඇස් හා සම කහ පැහැ ගැන්වීම මෙහිදී සිදු වේ.
- Poncreatitis පිත්තාශයේ නාල අවහිර වීමෙන් එය අසල පිහිටි අග්න්‍යාසයේ ඇතිවන ඉදිමීම් තත්වයකි. තදබල උදරයේ වේදනාවක් ඇති විය හැකිය.
- ක්‍යදක්බටසඑසි නමැති පිත්ත නාලය ගල් මඟින් අවහිරවී ආසාදනය වීමෙන් ඇතිවන තත්වයයි. උණ, උගුරයේ වේදනාව, ඇස් කහපැහැ වීම හා වෙව්ලීම මෙහි රෝග ලක්‍ෂණයි.

**රෝගය සඳහා ඇති ප්‍රතිකාර මොනවද ?**

රෝග ලක්‍ෂණ නොපෙන්වන රෝගීන් හට තම පිත්තාශය තුළ ගල් තිබු පමණින්ම ප්‍රතිකාර ගැනීමට අවශ්‍ය නොවේ. එවැනි රෝගින් හට ඉහත සඳහන් කල අතුරු ප්‍රතිවිපාක ඇති වීමේ අවධානමක් පවති නම් වෛද්‍ය නිර්දේශය වන පිත්තාශය ඉවත් කිරීම (ක්‍යදකැජහිඑැජඑදබහ) නමැති ශෛලය කර්මය සිදු කරනු ලැබේ.

විශේෂයෙන් නිතර රෝග ලක්‍ෂණ පෙන්වන රෝගීන් හට කල්තියා සැලසුම් කර පිත්තාශය ඉවත් කිරීමේ ශල්‍යකර්මය බොහෝවිට සිදු කරනු ලැබේ.

ශල්‍යකර්මයට අමතරව පහත සඳහන් ප්‍රතිකාර ක්‍රමද සිදුකරනු ලැබේ.

- ආහාර වෙනස්කම් මේදමය ආහාර හා කිරි ආහාර (Dairy Products) අඩුවෙන් පාවිච්චිය
- Lithotripsy නමැති ශබ්ද තරංග (Sound Waves) මගින් ගල් කුඩා කැබලි වලට තබා ඉවත් කිරීමේ ප්‍රතිකාර ක්‍රමය.
- ඖෂධමය ප්‍රතිකාර පිත්තාශයේ ගල් දියකල හැකි ඖෂධ පවතින නමුදු ඒවා මගින් ඇතිවිය හැකි අතුරු ආබාධ වැඩි නිසා බොහෝ විට ඒවා නිර්දේශ කරනු නොලැබේ.



- පිත්තාශය ඉවත් කිරීමේ ශෛලය කර්මය ක්‍රම 2 කට සිදු කළ හැකිය.

1. Laparoscopic cholocystomy නමැති Laparoscopy යනුවෙන් හැදින්වෙන කැමරාමය උපකරණයක් හරහා සිදුකරන ශෛල්‍යකර්මය මෙහිදි උදරය කපා විවෘත කිරිමක් සිදු නොකරන අතර කුඩා සිදුරු තුනක් හරහා උපකරණ යැවීමෙන් මෙය සිදු කරයි.
2. Open Surgery හෙවත් බැවීරදඑදපහ උදරයේ කැපුමක් මගින් වඩා විශාල ප්‍රදේශයක් විවෘත කර සිදුකරන ශෛල්‍යකර්මයයි.

මේ දිනවල ඉහත ක්‍රම දෙක අතරින් Laparoscopic Cholecystectomy නමැති ක්‍රමය වඩාත් භාවිතා කරන අතර එහි අතුරු ආබාධ (විශේෂයෙන් කැලැල් හෙවත් Scarring) අඩු නිසා රෝගින් මෙන්ම වෛද්‍යවරු අතරද මෙම ක්‍රමය වඩා ජනප්‍රියය.

